ජයලත් අප ස්වාමිදූගේ කන්‍යාරාමය මොරටුව -

පළමුවන වාර පරීක්ෂණය - 2018

ගණිතය

6 ශ්‍රේණිය | කාලය පැය 2 යි

## I කොටස

1) හාල් 2kg ක මිල රු. 230 ක් නම් හාල් 10kg ක මිල සොයන්න.

2) 375+425+8 හි අගය සොයන්න.

3) රැස්වීමක පිරිමි 65 ක්ද ගැහැණු 135 ක්ද සහභාගි වූ අතර ඉන් පිරිමි අය 13 ක් හා ගැහැණු අය 12 ක් අවසානයට පෙර පිටවී ගියහ. රැස්වීම අවසාන වන විට සිටි ඉතිරි සංඛ්‍යාව කොපමණද?

4) ගුණ නොකොට පිළිතුරු සපයන්න.

25 x 1000 = ________

180x ________ = 18000

5) විසඳන්න


324 ÷ 9

6) සංඛ්‍යා සටහන් කරන ලද රේඛාවක දැකිය හැකි මිනුම් උපකරණ 2 ක් නම් කරන්න.



7) සුදුසු සංකේත යොදන්න

-3 _____ -8 +3 _____ -6

8) 5 හා 8 යන නිඛිල දෙක අතර පිහිටි නිඛිල මොනවාද?

9) 

මෙම වීදුරු බෝතලයේ වීදුරු බෝල 30 ක් ඇත්නම් මෙම බෝතලයට දැමිය හැකි උපරිම වීදුරු බෝල සංඛ්‍යාව නිමානය කරන්න

10)  

.......................................          .......................................

ඉහත කෝණ කුමන වර්ගයට අයත්දැයි ලියන්න.

11) සියළු කෝණ වර්ග හඳුනාගැනීමට භාවිතා කල හැකි ඔබට පහසුවෙන් සාදාගතහැකි සරල ක්‍රමයක් ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

12) $-2 < 0$ මෙහි අදහස වචනයෙන් ලියන්න.

13) සෘජු කෝණ දෙකක විශාලත්වයට සමාන විශාලත්වයක් ඇති කෝණය හඳුන්වන නම කුමක්ද?

14) අනු දිශා 4 නම් කරන්න.

15) පහත සංඛ්‍යා ආසන්න 10 ට වටයන්න.

28 ________          41 ________

16) හිස්තැන් පුරවන්න.
කිසියම් දිශාවක් නිවැරදිව සොයාගැනීමට භාවිතා කරන උපකරණය (1)________________________ වේ.
එහි කටුව නිතරම (11) ____________________ දිශාවට යොමු වී ඇත.

17) අගය සොයන්න

135 x 23

18) පුටු 250 ක් එක් පේළියකට පුටු 25 බැගින් පේළි සකස් කරන ලදී. පේළි කීයක් සැකසිය හැකිද?

19) ආරෝහණ පටිපාටියට සකසන්න.

+2 , -5 , 0

20) මෙම සම්බන්ධතා සත්‍ය ද ? අසත්‍ය ද ? යන්න දක්වන්න.

-5 > -7 _______

0 > +1 _______


## II කොටස

1. <u>සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න</u>

1. 75302 ගණක රාමුවක ඇඳ පෙන්වන්න. (2)
2. ඉහත සංඛ්‍යාවේ 7 පිහිටා ඇති ස්ථානයේ නම කුමක්ද? (2)
3. 1067365473 යන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. (2)
4. එම සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න. (2)

To download past papers visit
www.vajirapani.blogspot.com


5.





A මඟින් දැක්වෙන්නේ ____________________ ය

B මඟින් දැක්වෙන්නේ ____________________ ය (2)

6.



01



o2

ඔරලෝසු මුහුණත් වල පෙන්වා ඇති කෝණ වර්ග නම් කරන්න. (2)

7. සෘජුකෝණය ඇඳ , සෘජු කෝණයක් පෙන්වන සංකේතය යොදන්න. (2)

8. (I) සිරස්තලයකට හා
(II) තිරස් තලයකට උදාහරණයක් බැගින් දෙන්න. (2)

2) (1) අගය සොයන්න.

(i) 39000 ÷ 1000 = ________

(ii) 6400 x 100 = ________

(2) මල්වත්තකින් රතුපාට මල් 367 ක් ද , කහපාට මල් 705 ක් ද සුදුපාට මල් 860 ක්ද දම්පාට මල් 92 ක් ද කඩා ගන්නා ලදී. කඩන ලද මුළු මල් ගණන කීයද? (2)

(3) වෙළෙන්දෙකු ඇපල් ගෙඩි 5006 ක් මිලදී ගෙන නරක්වීම නිසා 435 ක් ඉවත් කරන ලදී. ඉන්පසු 2999 ක් විකුණන ලදී. ඔහු ළඟ තව දුරටත් ඉතිරි ඇපල් ගෙඩි ගණන කීයද? (2)


(4) 765 x 28 සුදුසු ක්‍රමයකින් පිළිතුර ඉදිරිපත් කරන්න. (2)

(5) 20 | 288 මෙහි ලබ්ධිය හා ශේෂය සොයන්න. (2)

3)


(1) වෘත්තාකාර හැඩය දැකිය හැකි වස්තුන් 2 ක් නම් කරන්න. (2)

(2) වෘත්තය මත සහ වෘත්තයෙන් පිටත පිහිටන ලක්ෂයන් වෙන වෙනම නම් කරන්න. (2)




To download past papers visit
www.vajirapani.blogspot.com

(3) මෙම රූපයේ දැකිය හැකි වෘත්ත ගණන කීයද? (2)



(4) කේන්ද්‍රය ලබා ගැනීමට වෘත්තය නැමිය යුතු අඩුම වාර ගණන කීයද? (2)

(5) වෘත්ත 5 ක් යොදා ගනිමින් රටාවක් ගොඩ නගන්න. (2)

4.)

(a) -4 සිට +4 දක්වා සංඛ්‍යා රේඛාවක් අඳින්න.

(i) +3 , 0 , -1 ලකුණු කරන්න

(ii) එමලක්ෂ සන්සන්දනය කරමින් > , < සංකේත යොදා සැසඳුම් 2 ක් ලියන්න. (4)

(b) එක්තරා දිනක ලෝකයේ නගර කිහිපයක උෂ්ණත්වය සෙල්සියස් අංශක වලින් පහත දක්වා ඇත..

| | | | |
|---|---|---|---|
| මොස්කව් | $-12^0$ C | පීකිං | $-4^0$ C |
| ටෝකියෝ | $3^0$ C | ලන්ඩන් | $5^0$ C |

(i)වැඩිම උෂ්ණත්වයක් ඇති නගරය කුමක්ද? එහි උෂ්ණත්වය කීයද?

(ii)අඩුම උෂ්ණත්වයක් ඇති නගරය කුමක්ද? එහි උෂ්ණත්වය කීයද?

(iii)පීකිං හි උෂ්ණත්වයත් ලන්ඩන් හි උෂ්ණත්වයත් අතර ඇති වෙනස කීයද?

5.)


To download past papers visit
www.vajirapani.blogspot.com

(i)තිරස් හා සිරස් සරල රේඛා ඇඳ නම් කරන්න.

(ii)ප්‍රධාන දිශා 4 නම් කරන්න. (2)

(iii)A නම් ස්ථානයෙන් පටන්ගෙන දකුණු දිශාවට 5km ක් ගමන් ගොස් B නම් ස්ථානය හමුවේ. Bස්ථානයෙන්. 3km ක් නැවත නැගෙනහිර දිශාවට ගමන් කල පසු C නම් ස්ථානයේ පාසල පිහිටා ඇත. මෙම දෑ ඇඳ පෙන්වන්න. (ගමන් දිශාව පෙන්වන්න) (3)

(iv) අ) මේසයට වයඹ දිශාවෙන් පිහිටා ඇති අක්ෂරය කුමක්ද?
ආ) මේසයට නැගෙනහිර දිශවෙන් පිහිටා ඇති අක්ෂරය කුමක්ද?
ඇ) F ට ඊසාන දිශාවෙන් පිහිටා ඇති අක්ෂරය කුමක්ද?
ඉ) C ට බටහිර දිශාවෙන් පිහිටා ඇති අක්ෂරයකුමක්ද?






MATHS PAPERS.INFO
ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න